## මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2014

## மனிதவள மேம்பாட்டு நிறுவகம்
## கொழும்புப் பல்கலைக்கழகம், ஸ்ரீலங்கா
## ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்

**2014**

# INSTITUTE OF HUMAN RESOURCE ADVANCEMENT
# UNIVERSITY OF COLOMBO, SRI LANKA
# ANNUAL REPORT AND ANNUAL ACCOUNTS

**2014**

IHRA
UNIVERSITY OF COLOMBO

## පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| 1 | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව | 01 - 19 |
| 2 | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය | 20 |
| 3 | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම | 21 |
| 4 | විගණකාධිපති වාර්තාව | 22 - 27 |
| 5 | 2015 වර්ෂයට අදාල විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස් | 28 - 34 |


## பொருளடக்கம்

பக்கம்


| | | |
|---|---|---|
| 1. | 2014 ஆம் ஆண்டிற்கான ஆண்டறிக்கை | 35 - 54 |
| 2. | 2014 டிசெம்பர் 31 ஆந் திகதியில் ஐந்தொகை | 55 |
| 3. | 2014 டிசெம்பர் 31 ஆந் திகதியில் முடிவடைந்த ஆண்டிற்கான செலவினக் கணக்குகள் | 56 |
| 4. | பொதுக் கணக்குப்பரிசோதகர் அறிக்கை | 57 - 62 |
| 5. | 2015 ம் ஆண்டுக்கான கணக்காய்வு சம்பந்தமான கருத்ததுக்கள் | 63 - 68 |


## Contents

Page No.


| | | |
|---|---|---|
| 1 | Annual Report for the year 2014 | 69 - 86 |
| 2 | Balance Sheet as at 31st December, 2014 | 87 |
| 3 | Income and Expenditure Account for the year Ended 31st December, 2014 | 88 |
| 4 | Auditor General's Report | 89 - 93 |
| 5 | Comments of the IHRA on the Auditor General's Report in the year 2015 | 94 - 99 |

# මානව සම්පත් අභිවර්ධන ආයතනය (*IHRA*)
# කොළඹ විශ්වවිද්‍යාලය

## වාර්ෂික වාර්තාව - 2014

### 01. හැඳින්වීම

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූලාරම්භය සේවක අධ්‍යාපන ආයතනයෙන් සිදුවිය. 1979 දෙසැම්බර් 26 වන දින අංක 68/Æ10 දරන නියමාවලිය යටතේ 1980 ජනවාරි 01 වන දින සේවක අධ්‍යාපන ආයතනය පිහිටුවන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2006 ජුනි 22 දිනැති ගැසට් නිවේදනය මගින් 2009 පෙබරවාරි මස 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි මානව සම්පත් අභිවර්ධන ආයතනය ස්ථාපිත කෙරිණ. "දැනුම් ආර්ථිකය" හරහා ගෝලීය සහ කලාපීය වර්ධනයන්ට අනුව මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) ඉදිරියටත් වර්ධනය වෙමින් පවතී.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන ප්‍රථම අධ්‍යයන වැඩසටහන වන අතර එය දැනුමැති සේවකයාගේ නූතන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සුළු වෙනස්කම් සහිතව පවත්වාගෙන යනු ලබයි.

ආයතනය පිහිටුවනු ලැබූ පසුගිය කාලයේ දී "දැනුමැති සේවකයින්" යන යෙදුම උපයෝගී කරගනු නොලැබුවත් සේවා නියුක්ත සේවා කණ්ඩායම් සඳහා අධ්‍යාපනයක් ලබා දීමේ මූලික පරමාර්ථය නොවෙනස්ව පැවතිණ. එතෙකුදු වුවත් වර්තමාන දැනුමැති සේවකයා යන කාණ්ඩයට සාම්ප්‍රදායික සේවා කණ්ඩායම් මෙන්ම කළමනාකරණ කාණ්ඩය ද ඇතුළත් වන අතර, "දැනුමැති සේවකයන්" මානව සම්පත් සම්බන්ධයෙන් ඕනෑම කාණ්ඩයක් අභිවර්ධනය කිරීමට ආයතනයේ වර්තමාන ප්‍රතිපත්ති පිළියෙළ කර ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනනයේ (IHRA) මූලික සංකල්පය වන්නේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පවත්නා තත්ත්වයන් රඳවා ගනිමින් සේවාවන්හි නියුක්ත වූවන්ට අධ්‍යාපනය ලබාදෙන අතර රටට සේවය කිරීමයි.

## 02. දැක්ම

**දැක්ම**

අභියෝගාත්මක

ගෝලීය තත්වයනට

මුහුණ දිය හැකි

සහ

අපගේ ජාතික සංවර්ධනයේ

මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත

සහ

බුද්ධිමත්

දැනුම-භාවිතකරන්නන්ම

ලෙසින්

මානව සම්පත

අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇප

කැප වූ

ඉහළම තත්වයේ

පිළිගත් ආයතනයක්

බවට පත්වීමටය.

## 03. මෙහෙවර

# මෙහෙවර

"උපයමින් ඉගෙනීම් කරන
සේව්‍යය, සේවක සහ ව්‍යවසායක වූ
සේවා-කාණ්ඩ සඳහා, තම හැකියාවන් ඉහළ නැංවීමට
පූර්ණ තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ
ඉහල මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට
පහසුකම් සපයමින් මග පෙන්වීම.

ඔවුන්ගේ විචාරාත්මක සහ තර්කානුකූලව
සිතීමේ හැකියාව, ආචාරධර්ම,ප්‍රමිතීන්, ව්‍යවසාය දක්‍ෂතා,
නායකත්ව ලක්‍ෂණ,

සහ
යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බව
අවබෝධ කොට ගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය කර
ගැනීමට තව දුරටත් මග පෙන්වීම.
දේශයේ දැනුම්-ආර්ථිකය

සඳහා
බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක්
දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස
පෙළ ගැසුනු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට
කැපවීම.

## 04. අධ්‍යක්‍ෂ වාර්තාව

මානව සම්පත් අභිවර්ධන ආයතනය, වැඩිහිටි සහ සේවා නියුක්තිකයන්ගේ කෘත්‍යාත්මක සහ විධිමත්, උසස් අධ්‍යාපන කටයුතු මෙන්ම විධිමත් නොවන අධ්‍යාපන කටයුතු ද බෙදා හැරීම සඳහා විශේෂිත වූ ආයතනයක් වේ. සම්බන්ධීකාරකවරුන් යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන අධ්‍යයන වැඩසටහන් 6 ක් ආයතනය සතුව පවති. ඒවා නම්,

1. ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන
2. මානව සම්පත් අධ්‍යාපන වැඩසටහන
3. සේවා කළමනාකරණ වැඩසටහන
4. ව්‍යාප්ති වැඩසටහන්
5. භාෂා අධ්‍යයන වැඩසටහන
6. තොරතුරු තාක්‍ෂණ වැඩසටහන

නියමාවලියට අනුව පත්කරනු ලබන වෘත්තිමය සාමාජිකයන් සහ තෝරා පත් කර ගන්නා ලද නියෝජිතයින්ගෙන් සැදුම් ලත් ශාස්ත්‍රීය කමිටුව සහ අධ්‍යයන මණ්ඩල ව්‍යවස්ථාපිත ව්‍යුහයකින් ශාස්ත්‍රීය කමිටුව සමන්විතය.

2014 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද විවිධ පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී ඇති සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 8419 කි.

2014 වර්ෂය තුළදී ද මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වන ලද මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, සේවා කළමනාකරණය, භූවිද්‍යා තොරතුරු විද්‍යාපති පාඨමාලාව හා ආපදා කළමනාකරණ සහ පාලනය විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහා රටට වැඩදායි වෘත්තිය දැනුම් ශ්‍රමික විද්‍යාර්ථීන් විශාල සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගැනීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකිවිය. 2014 වර්ෂය තුළ නව පාඨමාලාවන් කිහිපයක්ම හඳුන්වා දීමටත් ශිෂ්‍යයින්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩමුළු රාශියක් පැවැත්වීමටත් ආයතනයට හැකියාව ලැබුණි.


වර්තමානයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය පිරිනමන පාඨමාලා සඳහා පවතින ඉල්ලුමට අනුරූපව ඉඩකඩ පහසුකම් වර්ධනය කිරීමට පවත්නා භූමිය ප්‍රමාණවත් නොවීම විශාල ගැටලුවක්ව පවති. ආයතනයේ ඉඩකඩ වර්ධනය කිරීමට නව ගොඩනැගිල්ලක අවශ්‍යතාව ප්‍රබලව දැනී ඇත.

| | |
|---|---|
| එම්. පී. පී. හේමකුමාර | **අ/කළේ : නියෝජ්‍ය ලේඛකාධිකාරී** |
| **වැ. බ.** අධ්‍යක්‍ෂ | මා. ස. අ. ආ. |


## 05. කළමනාකරණය

2006 අංක 01 දරන නියමාවලියෙන් සංශෝධනය කරනු ලැබූ 1979 අංක 11 දරන නියමාවලිය මගින් ආයතනයේ වැඩකටයුතු පාලනය වන්නේය. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන අතර එහි ශාස්ත්‍රීය කමිටුවේ (Academic Syndicate) නිර්දේශය මත පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ ගිණුම් නිලධාරියා වන අතර අධ්‍යයන සහ පරිපාලන නිලධාරියා ද වන්නේය. ශාස්ත්‍රීය කමිටුව ආයතනයේ අධ්‍යයන සේවා අධිකාරිය වන්නේය. 2014 වර්ෂයේ මුල්භාගයේදි එනම්> 2014 ජනවාරි මස 01 වන දින සිට අගෝස්තු මස 08 වන දින තෙක් ආචාර්ය රොහාන් පී. පෙරේරා මහතා සේවය කරන ලද අතර> 2014 අගෝස්තු මස 19 වන දින සිට එම්. පී. පී. හේමකුමාර මහතා ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂවරයා වශයෙන් තේරී පත් විය.

### 05.1 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන ව්‍යුහය



## මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල ව්‍යුහය




### 05.2.1 ශාස්ත්‍රීය කමිටුව

ශාස්ත්‍රීය කමිටුව ව්‍යවස්ථානුකූල මණ්ඩලයක් වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටු සාමාජිකයන් පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| 1 | **ආචාර්ය රොහාන් පී. පෙරේරා** | සභාපති (2014 අගෝස්තු මස දක්වා) |
| | **එම්. පී. පී. හේමකුමාර මහතා** | සභාපති (2014 අගෝස්තු මස සිට) |
| 2 | **මහාචාර්ය අතුල රණසිංහ** | නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ |
| 3 | **මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස** | නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ |
| 4 | **මහාචාර්ය ටී. ආර්. ආරියරත්න** | නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ |
| 5 | **වෛද්‍ය පාලිත මහීපාල මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 6 | **ඒ. පී. ගුණරත්න මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 7 | **මේජර් ජෙනරාල් කේ. හෙන්දවිතාරණ මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 8 | **ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 9 | **ආර්. ඒ. යූ. රණවීර මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 10 | **කේ. ආර්. උඩුවාවෙල මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 11 | **කේ. ගමගේ මහතා** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 12 | **හදානි ජයවර්ධන මහත්මිය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 13 | **ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා** | මහා භාණ්ඩාගාර නියෝජිත |
| 14 | **එම්. පී. පී. හේමකුමාර මහතා** | අධ්‍යයන මණ්ඩල නියෝජිතයින් |
| 15 | **ආර්. එම්. ආර්. බී. රාජපක්ෂ මහතා** | අධ්‍යයන මණ්ඩල නියෝජිතයින් |
| 16 | **කේ. පී. මාතොටආරච්චි මහත්මිය** | අධ්‍යයන මණ්ඩල නියෝජිතයින් |
| 17 | **බී. කේ. පී. අබේසූරිය මහත්මිය** | අධ්‍යයන මණ්ඩල නියෝජිතයින් |

### 05.2.2 අධ්‍යයන මණ්ඩල තොරතුරු

අධ්‍යයන මණ්ඩල තුනෙහිම විස්තර සහ සාමාජිකයින් පහත දක්වා ඇත.

**අධ්‍යයන මණ්ඩලය - මානව සම්පත් අධ්‍යාපන වැඩසටහන්**

| | | |
|---|---|---|
| 1. | එම්. පී. පී. හේමකුමාර මහතා | සභාපති |
| 2. | කේ. පී. මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 3. | ආචාර්ය පී. මහානාමහේවා මහතා | සාමාජික |
| 4. | ආචාර්ය එන්. එන්. ජේ. නවරත්න මහතා | සාමාජික |
| 5. | ආචාර්ය පී. කයිලාසපති මිය | සාමාජික |
| 6. | ආර්. එම්. ආර්. බී. රාජපක්ෂ මහතා | සාමාජික |

**අධ්‍යයන මණ්ඩලය - ව්‍යාප්ති පාඨමාලා වැඩසටහන්**

| | | |
|---|---|---|
| 1. | කේ. පී. මාතොටආරච්චි මහත්මිය | සභාපති |
| 2. | එම්. පී. පී. හේමකුමාර මහතා | සාමාජික |
| 3. | කේ. ගමගේ මහතා | සාමාජික |
| 4. | ආචාර්ය සී. එම්. එදිරිසිංහ මහතා | සාමාජික |
| 5. | ඩබ්. එස්. චන්ද්‍රසේකර මහතා | සාමාජික (අධ්‍යයන නිවාඩු) |

**අධ්‍යයන මණ්ඩලය - භාෂා අධ්‍යයන වැඩසටහන්**

| | | |
|---|---|---|
| 1. | බී. කේ. පී. අබේසූරිය මහත්මිය | සභාපති |
| 2. | එල්. පී. ආරියසේන මහතා | සාමාජික |
| 3. | ආර්. එම්. තිලකරත්න මහතා | සාමාජික |
| 4. | ටී රාජේන්ද්‍රම් මහතා | සාමාජික |
| 5. | ඩබ්. එස්. චන්ද්‍රසේකර මහතා | සාමාජික (අධ්‍යයන නිවාඩු) |

## 06. අධ්‍යයන වැඩසටහන්

### 06.01 ශ්‍රම අධ්‍යාපන උපාධි වැඩසටහන

මෙය ශ්‍රමික ප්‍රජාව උදෙසා මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන තුන් අවුරුදු උපාධි පාඨමාලාවකි. මෙම වැඩසටහන ප්‍රධාන අංග දෙකකින් (02) සමන්විතය. ඒ උපාධිය සහ ඩිප්ලෝමාව වශයෙනි. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අයවලුන් උපාධි පළමු වසර සඳහා බඳවා ගැනීම සඳහා එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවත් ඊට අදාළ පරීක්ෂණත් සම්පූර්ණ කළ යුතුය. මෙය රාජ්‍ය භාණ්ඩාගාර අරමුදල් මත ක්‍රියාත්මක වන වැඩසටහනකි. පසුගිය 2014 වර්ෂයේ දී මෙම අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම් සඳහා ලියාපදිංචි වූ සමස්ථ විද්‍යාර්ථීන් සංඛ්‍යාව 553 කි. පසුගිය වසර පහ (05) තුළ වැඩසටහනේ කාර්ය සාධනය පහත දක්වා ඇත.

**ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව - 2010 - 2014**
**ශ්‍රම අධ්‍යාපන උපාධි වැඩසටහන**

| පාඨමාලාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා වැඩසටහන | 54 | 60 | 54 | 55 | 59 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන | 125 | 111 | 221 | 189 | 206 |
| එකතුව | 179 | 171 | 275 | 244 | 265 |

**සාමාර්ථ ලත් විද්‍යාර්ථීන් සංඛ්‍යාව - 2010 - 2014**
**ශ්‍රම අධ්‍යාපන උපාධි වැඩසටහන**

| පාඨමාලාව | සමත් විද්‍යාර්ථීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා වැඩසටහන | 39 | 37 | 37 | 49 | 37 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන | 145 | 150 | 112 | 153 | 153 |

## 06.02 මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ සිටින කළමනාකරුවන්, විභව්‍ය කළමනාකරුවන් වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් කළමනාකරණ පාඨමාලාවන් පිරිනමනු ලබයි. පන්ති කාමර සැසි, ක්ෂේත්‍ර අධ්‍යයනයන්, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම තුළින් පාඨමාලාලාභීන්ගේ දැනුම, කුසලතා මෙන්ම ආකල්ප වර්ධනයක්ද ඇති කළ හැකි බව මානව සම්පත් අභිවර්ධන ආයතනය දැඩිව විශ්වාස කරයි. කළමනාකරණ ක්ෂේත්‍රය තුළ පාඨමාලාලාභීන්ට මූලිකම අදියරේ සිට පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීම දක්වා වූ ක්‍රමවත් ක්‍රමවේදයකට සැකසුණු අධ්‍යයන මාර්ගයක් ඔස්සේ කළමනාකරණ අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. පාඨමාලාලාභීන්ට, ඔවුන් සතු සුදුසුකම් සහ අවශ්‍යතා අනුව මෙම අධ්‍යයන ගමන් මගේ ඕනෑම පාඨමාලාවකට සහභාගි වී තම සුදුසුකම් සපුරා ගැනීමෙන් ඕනෑම අවස්ථාවක දී ඉවත්ව යාමේ හැකියාව මෙම අධ්‍යයන මාර්ගයේ ඇති සුවිශේෂී ගති ලක්ෂණයක් ලෙස දැක්විය හැක. අත්‍යාවශ්‍ය, වඩාත් ප්‍රායෝගික සහ නවීනතම විෂය ඒකක අන්තර්ගත මෙම පාඨමාලාවන් විශිෂ්ට අධ්‍යයන කාර්ය මණ්ඩලයක පහසුකම් තුළින් ලබා දීමට කටයුතු කෙරේ. මෙම වැඩසටහන ස්වයං - මූල්‍ය වැඩසටහනක් වන අතර එහි පාඨමාලාවන් වර්ග තුනක් (03) අන්තර්ගතය. ඒවා නම්, විද්‍යාපති, විධායක ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලා වශයෙනි. 2014 වර්ෂය තුළ පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාන 645 කි. වැඩසටහනේ කාර්ය සාධනය පහත දක්වා ඇත.

**මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන වැඩසටහන්හි පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය (2012 - 2014)**

| වැඩසටහන (කාලය : වසර 02) | 2012 හා 2014 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පළමු සෙමෙස්තරය | | දෙවන සෙමෙස්තරය | | තෙවන සෙමෙස්තරය | | සිව්වන සෙමෙස්තරය | |
| | ලියාපදිංචි | සමත් | ලියාපදිංචි | සමත් | ලියාපදිංචි | සමත් | ලියාපදිංචි | සමත් |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය - අංක 01 | 104 | 86 | 96 | 88 | 94 | 91 | 90 | 77 |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය - අංක 02 | 160 | 137 | 145 | 129 | - | - | - | - |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය - 03 | 184 | 142 | 160 | 133 | 165 | 124 | 143 | 113 |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය - 04 | 170 | 134 | 131 | 142 | - | - | - | - |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය - 05 | 149 | - | - | - | - | - | - | - |

**මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන වැඩසටහන්හි විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය - 2014**

| වැඩසටහන (කාලය : වසර 01) | 2014 | | | |
|---|---|---|---|---|
| | පළමු සෙමෙස්තරය | | දෙවන සෙමෙස්තරය | |
| | ලියාපදිංචි | සමත් | ලියාපදිංචි | සමත් |
| මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමා වැඩසටහන - 03 | - | - | 56 | 34 |
| මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමා වැඩසටහන - 04 | 95 | - | - | - |

**මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන වැඩසටහන්හි සහතිකපත් පාඨමාලාවන්හි කාර්ය සාධනය - 2014**

| වැඩසටහන (කාලය : මාස 07) | 2014 | |
|---|---|---|
| | ලියාපදිංචි | සමත් |
| කළමනාකරණ සහතිකපත් පාඨමාලාව - 03 | 20 | 11 |
| කළමනාකරණ සහතිකපත් පාඨමාලාව - 04 | 92 | - |

## 06.3 සේවා කළමනාකරණ වැඩසටහන

සේවා ක්ෂේත්‍රය තුළ පාරිභෝගිකයන් සමග ගණුදෙනු කිරීමේදී උසස් තත්වයේ පාරිභෝගික සේවාවක් ඉටු කිරීම සඳහා දැනුම ලබා දීම අපේක්ෂාවෙන් මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් මෙම සේවා කළමනාකරණ පාඨමාලාවන් දියත් කරනු ලැබ ඇත. සේවා කළමනාකරණ පාඨමාලා වැඩසටහන මගින් වර්තමානයේ සහ අනාගතයේ සේවා වෙළඳ පොළ තුළදී අවශ්‍ය කරන්නා වූ කුසලතා සමග සංවිධානාත්මකබව ලබා ගැනීමට යොමු කරවයි. සේවා කළමනාකරණ පාඨමාලා වැඩසටහන විශේෂයෙන්ම නිර්මාණය කොට ඇත්තේ සේවාවන් ලබා දීමේදී අපේක්ෂිත ඵලදායිතාව සහ ගුණාත්මකබව මනා කළමනාකාරිත්වයකින් මෙන්ම විද්‍යාත්මක ශික්ෂණයකින් යුක්තව ලබා දීම අපේක්ෂා

කරන්නා වූ වෘත්තිකයන් වෙනුවෙනි. 2014 වර්ෂය තුළ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 410 ක් වන අතර එහි කාර්ය සාධනය පහත දක්වා ඇත.

**සේවා කළමනාකරණ අධ්‍යයන වැඩසටහන්හි පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය - 2014**

| වැඩසටහන (කාලය : වසර 02) | ලියාපදිංචි |
|---|---|
| සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව (සිංහල මාධ්‍ය) - අංක 02 | 62 |
| සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) - අංක 02 | 50 |

**සේවා කළමනාකරණ අධ්‍යයන වැඩසටහන්හි ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය (2013 - 2014)**

| වැඩසටහන (කාලය : වසර 01) | 2013 - 2014 | | | |
|---|---|---|---|---|
| | පළමු සෙමෙස්තරය | | දෙවන සෙමෙස්තරය | |
| | ලියාපදිංචි | සමත් | ලියාපදිංචි | සමත් |
| සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව - අංක. 02 | - | - | 72 | 50 |
| සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව - අංක. 03 | 83 | - | - | - |
| සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - අංක. 01 | - | - | - | 7 |
| සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - අංක. 02 | - | - | 69 | 57 |
| සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - අංක. 03 | 74 | - | - | - |

## 06.04 ව්‍යාප්ති වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනික දැක්ම සහ මෙහෙවර පවත්වා ගනිමින් වෘත්තිමය විශිෂ්ටත්වය ලබා ගැනීම සඳහා උසස් තත්වයෙන් යුත් ව්‍යාප්ති පාඨමාලාවන් දියත් කිරීම මෙමගින් සිදු කෙරේ. මෙම බොහෝ ව්‍යාප්ති පාඨමාලාවන් වෙනත් ආයතන සමග ඇති කොට ගත් සහයෝගිත්වය පදනම්ව පවත්වාගෙන යනු ලැබේ. ශිෂ්‍යයින්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම, මනා පැවැත්ම සහ ආතතියකින් තොරව ගැටලු නිරාකරණය සහ උසස් ඵලදායිත්වයකින් යුත් ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාව වැඩි කිරීමටත් හැකි වන පරිදි පාඨමාලාවන්හි අධ්‍යයන උපකාරක නිර්මාණය කොට ඇත. මෙම වැඩසටහන්ද ස්වයං - මූල්‍ය වැඩසටහන් වේ. ජාත්‍යන්තර තත්වය හා සසඳන කල ඉතා අඩු පාඨමාලා ගාස්තු යටතේ ජාත්‍යන්තර තත්වයට සමානවම තත්වය පවත්වා ගනිමින් ඉතා හොඳ ජාත්‍යන්තර මට්ටමේ පාඨමාලාවන් මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනය ශිෂ්‍යයින්ට දැනුම ලබා දේ. 2014 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ව්‍යාප්ති වැඩසටහන් අංශය මගින් පවත්වන ලද පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී ඇති සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 1334 කි. වැඩසටහනේ කාර්ය සාධනය පහත දක්වා ඇත.

**ව්‍යාප්ති පාඨමාලා අධ්‍යයන වැඩසටහනේ පශ්චාත් උපාධි වැඩසටහන්හි කාර්ය සාධනය (2012 - 2014)**

| වැඩසටහන (කාලය : වසර 02) | 2012/ 2014 | |
|---|---|---|
| | ලියාපදිංචි | සමත් |
| භූ විද්‍යා තොරතුරු විද්‍යාපති පාඨමාලාව - අංක 1 සි | 44 | - |
| ආපදා කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව - අංක 01 | 65 | 25 |
| ආපදා කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව - අංක 02 | 50 | - |

**ව්‍යාප්ති පාඨමාලා අධ්‍යයන වැඩසටහනේ ඩිප්ලෝමා වැඩසටහන්හි කාර්ය සාධනය (2013 - 2014)**

| වැඩසටහන (කාලය : වසර 01) | ලියාපදිංචි | සමත් |
|---|---|---|
| ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව- අංක 01 | 44 | 25 |
| ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව- අංක 01 | 29 | - |
| මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - අංක 06 | 37 | 11 |
| මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - අංක 07 | 44 | 25 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමාව - අංක 04 | 62 | 31 |
| උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව - අංක 02 | 27 | 25 |
| උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව - අංක 03 | 50 | 36 |
| වෛද්‍ය විද්‍යාගාර විද්‍යා ඩිප්ලෝමාව - අංක 01 | 45 | - |

**ව්‍යාප්ති පාඨමාලා අධ්‍යයන වැඩසටහනේ සහතිකපත් පාඨමාලාවන්හි කාර්ය සාධනය 2014**

| වැඩසටහන | 2014 | |
|---|---|---|
| | ලියාපදිංචි | සමත් |
| පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව - අංක 05 | 14 | 14 |
| පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව - අංක 06 (කණ්ඩායම 01) | 104 | 93 |
| පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව - අංක 06 (කණ්ඩායම 02) | 116 | 106 |
| පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව - අංක 07 | 315 | - |
| උපදේශන මනෝවිද්‍යාව සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම අංක 03 | 61 | 54 |
| උපදේශන මනෝවිද්‍යාව සහතිකපත් පාඨමාලාව - මූලික අංක 04 | 74 | 55 |
| උපදේශන මනෝවිද්‍යාව සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම අංක 04 | 54 | 39 |
| උපදේශන මනෝවිද්‍යාව සහතිකපත් පාඨමාලාව - මූලික අංක 05 | 86 | - |
| ග්‍රැෆික් නිර්මාණකරණය සහතිකපත් පාඨමාලාව - අංක 01 | 13 | 13 |

## 06.05 භාෂා අධ්‍යයන වැඩසටහන්

පාසල් හැර ගිය සහ රැකියා අපේක්ෂක යෞවන යෞවනියන් උදෙසා මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පාඨමාලාවන් පවත්වා ගෙන යනු ලබයි. ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව, ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව, පදනම් ඉංග්‍රීසි පාඨමාලාව සහ කථන ඉංග්‍රීසි පාඨමාලාව යන ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් මගින් ඉංග්‍රීසි භාෂා කුසලතාව වර්ධනය කර ගැනීමට පාඨමාලාලාභීන්ට හැකියාව ලැබිණ. දමිළ භාෂා ඩිප්ලෝමා වැඩසටහන තුළින් සිංහල මව්බස වන ශිෂ්‍යයින් අතිරේක භාෂාවක් වශයෙන් දමිළ භාෂා දැනුම ලබා දෙන අතරම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ජාතික විභාගයන් සඳහා ශිෂ්‍යයින් පුහුණු කිරීම උදෙසා එම දෙපාර්තමේන්තු පාඨ ග්‍රන්ථ උපයෝග කොට ගනිමින් පවත්වාගෙන යනු ලබයි. මෙහි දී අවම පාඨමාලා ගාස්තුවක් සහ උසස් තත්වය පවත්වා ගැනීම ජාතික සේවයක් ඉටු කිරීමට වැදගත් කොට සළකයි. මෙම වැඩසටහන් ද ස්වයං - මූල්‍ය වැඩසටහන් වේ. පසුගිය වසර පහ (05) තුළ වැඩසටහන්වල කාර්ය සාධනය පහත දක්වා ඇත.

**භාෂා අධ්‍යයන වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව (2010 - 2014)**

| වැඩසටහන | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 3865 | 3831 | 2986 | 1806 | 2206 |
| ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 264 | 146 | 112 | 74 | 99 |
| කථන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | - | 590 | 740 | 570 | 1707 |
| ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව | - | - | 340 | 141 | 259 |
| කෙටි කාලීන ඉංග්‍රීසි පාඨමාලාව | - | - | - | 60 | 215 |
| දමිළ භාෂා ඩිප්ලෝමාව (අතිරේක භාෂාවක් වශයෙන්) | 1100 | 1212 | 1059 | 1095 | 1101 |

**භාෂා අධ්‍යයන වැඩසටහන්වල කාර්ය සාධනය**
**සාමාර්ථ ලත් විද්‍යාර්ථීන් සංඛ්‍යාව (2010 - 2014)**

| වැඩසටහන | සාමාර්ථ ලත් විද්‍යාර්ථීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | **2010** | **2011** | **2012** | **2013** | **2014** |
| ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 2797 | 2808 | 2737 | 2392 | 1665 |
| ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 180 | 102 | 105 | 71 | 67 |
| කථන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | - | - | 325 | 540 | 544 |
| ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව | - | - | 225 | 229 | 132 |

## 06.6 තොරතුරු තාක්ෂණ අධ්‍යයන වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය ඇමරිකා එක්සත් ජනපදයේ සිස්කෝ ජාලකරණ විද්‍යායතනය (CISCO Networking Academy) හා සිස්කෝ සහතිකලත් ජාලකරණ වෘත්තිය පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. සිස්කෝ ආයතන සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ මූලික පාඨමාලාව තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ආරම්භක මට්ටමේ රැකියා අවස්ථා හෝ ඊට වඩා වැඩි තොරතුරු සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයන් වෙනුවෙන් නිර්මාණය කොට ඇති අතර සිස්කෝ ආයතන සහතිකලත් ජාල ආශ්‍රිත ආරක්ෂණ පාඨමාලාව මගින් එහි ඉදිරි පියවර සම්පූර්ණ කරනු ලබයි. මෙම ආරක්ෂණ පාඨමාලාව මගින් ජාල ආරක්ෂණ වෘත්තිකයන්ගේ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට ක්‍රියා කරනු ලබයි.

**මානව සම්පත් අභිවර්ධන ආයතනයේ තොරතුරු තාක්ෂණ වැඩසටහන්වල කාර්ය සාධනය (2014 වර්ෂයේදී බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව)**

| වැඩසටහන | 2013/ 2014 | |
|---|---|---|
| | ලියාපදිංචි | සමත් |
| සිස්කෝ සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ පාඨමාලාව 14/01 | 28 | - |
| සිස්කෝ සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ පාඨමාලාව 14/02 | 28 | 14 |
| සිස්කෝ සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ පාඨමාලාව 14/03 | 17 | - |
| සිස්කෝ සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ පාඨමාලාව 14/04 | 16 | - |
| ITE + MCP/ 14/01 | 14 | - |
| එම්සීඑස්ඒ මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණ ආයතනය අයිඑච්ආර්ඒ/එම්එස්/14/01 | 16 | 10 |
| එම්සීඑස්ඒ මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණ ආයතනය අයිඑච්ආර්ඒ/එම්එස්/14/02 | 12 | 08 |
| එම්සීඑස්ඒ මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණ ආයතනය අයිඑච්ආර්ඒ/එම්එස්/14/03 | 14 | 08 |

## 07 2014 වර්ෂයේදී පවත්වන ලද වැඩමුළු

- මානව සම්පත් කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පින්නවල | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව - අංක 01 | 2014 ජනවාරි 14 සහ 15 | නිබන්ධ යෝජනා ඉදිරිපත් කිරීම් | 85 |
| කොත්මලේ | | 2014 පෙබරවාරි 23 සහ 24 | පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීම් | 66 |
| කොත්මලේ | ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 02> කණ්ඩායම 02 | 2014 මාර්තු 27 සහ 28 | මානව සම්පත් කළමනාකරණය | 46 |
| කොත්මලේ | ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 02> කණ්ඩායම 01 | 2014 මාර්තු 01 සහ 02 | මානව සම්පත් කළමනාකරණය | 77 |
| තුල්හිරිය | ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 01 | 2014 ජුලි 12 සහ 13 | අපාය මාර්ගික කළමනාකරණය | 88 |
| ඔරුතොට | ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 03> කණ්ඩායම 02 | 2014 නොවැම්බර් 29 සහ 30 | කළමනාකරණයේ මූලිකාංග | 102 |
| | ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 03> කණ්ඩායම 01 | 2014 දෙසැම්බර් 06 සහ 07 | කළමනාකරණයේ මූලිකාංග | 45 |
| ඔරුතොට | මානව සම්පත් කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 03 | 2014 පෙබරවාරි 22 සහ 23 | උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය | 84 |
| ඔරුතොට | මානව සම්පත් කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 05> කණ්ඩායම 01 | 2014 සැප්තැම්බර් 05 සහ 06 | පුද්ගල සහ සංවිධාන කළමනාකරණය | 63 |
| ඔරුතොට | මානව සම්පත් කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 05> කණ්ඩායම 02 | 2014 සැප්තැම්බර් 06 සහ 07 | පුද්ගල සහ සංවිධාන කළමනාකරණය | 70 |
| ඔරුතොට | මානව සම්පත් කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 04 සහ ව්‍යාපාර කළමනාකරණ පාශ්චාත් උපාධි පාඨමාලාව - අංක 02 | 2014 නොවැම්බර් 06 සහ 07 | නිබන්ධ යෝජනා ඉදිරිපත් කිරීම් | 42 |
| කොත්මලේ | ව්‍යාපාර කළමනාකරණ විධායක ඩිප්ලෝමා - අංක 03 | 2014 මාර්තු 23 සහ 24 | දීර්ඝ රචනා යෝජනා ඉදිරිපත් කිරීම් | 48 |

- ව්‍යාප්ති පාඨමාලා අංශය විසින් පවත්වන ලද වැඩමුළු

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| දියතලාව | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව - අංක 01 | 2014 අගෝස්තු 08 සහ 09 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 40 |
| පුත්තලම | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව - අංක 01 | 2014 මැයි 16 සහ 18 | කාර්මික ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 64 |
| හම්බන්තොට | උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව - අංක 03 උසස් අදියරය | 2014 අගෝස්තු 02 සිට 04 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 56 |
| පොතුහැර | උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව - අංක 04 අන්තර්මධ්‍යම අදියරය | 2014 නොවැම්බර් 21 සහ 22 | උපදේශනය | 60 |

| | | | | |
|---|---|---|---|---|
| වැලිකඩ බන්ධනාගාරය, පල්ලෙකැලේ | උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව - අංක 05 මූලික අදියරය | 2014 දෙසැම්බර් 20 සහ 21 | උපදේශන ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 96 |
| හන්තාන | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව - අංක 01 | 2014 පෙබරවාරි 01 සහ 02 | විවෘත සිමා පුහුණු වැඩසටහන | 22 |
| පොළොන්නරුව | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - අංක 07 | 2014 ජූනි 06 සිට 08 | පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රජා සේවා පුහුණු වැඩසටහන | 48 |

- පුස්තකාලය විසින් පවත්වන ලද වැඩමුළු

| ස්ථානය | අංශය | දින/ දිනයන් | මාතෘකාව | සහභාගී වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|---|
| ම.ස.අ.ආ. | පුස්තකාලය, මානව සම්පත් අභිවර්ධන ආයතනය | 2014 ජූලි 11 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 35 |
| ම.ස.අ.ආ. | පුස්තකාලය, මානව සම්පත් අභිවර්ධන ආයතනය | 2014 අගෝස්තු 06 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 59 |
| ම.ස.අ.ආ. | පුස්තකාලය, මානව සම්පත් අභිවර්ධන ආයතනය | 2014 ඔක්තෝබර් 09 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 50 |
| කොළඹ විශ්වවිද්‍යාලය | පුස්තකාලය, මානව සම්පත් අභිවර්ධන ආයතනය | 2014 නොවැම්බර් 11 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 81 |

## 08. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| පර්යේෂකයාගේ නම | මාතෘකාව | දිනය | ස්ථානය/ප්‍රකාශනය |
|---|---|---|---|
| එම්.පී.පී. හේමකුමාර මහතා | කණ්ඩායම් සංසක්ත සේවක අභිප්‍රේරණය (වෙළුම 1 - නිකුතුව 6) | 2014 ජූලි - සැප්තැ. කලාපය | ව්‍යාපාර සහ පරිපාලන ජාත්‍යන්තර ජර්නලය |
| | නායකත්ව ශෛලීන් සහ සේවක අභිප්‍රේරණය | ප්‍රථම මුද්‍රණය, 2014 | වාණිජ සහ කළමනාකරණ ගතිකත්වයන් |
| ආර්.එම්.එස්.එන්. රත්නායක මිය | කොළඹ විශ්වවිද්‍යාල මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතා වැඩසටහන් | 2014 නොවැ. 29 | උසස් අධ්‍යාපන ආයතනයන්හි දැනුම් කළමනාකරණය සහ සන්නිවේදනය, අන්තර්ජාතික සමුළුව, කේරළ විශ්වවිද්‍යාලය, අන්ද්‍රා ප්‍රදේශය, ඉන්දියාව |

# 09. අධ්‍යයන කාර්ය මණ්ඩලය> පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

## 09.01 2014 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු

| නම | තනතුරු නාමය | විෂය | මාධ්‍යය |
|---|---|---|---|
| ආචාර්ය රොහාන් පී. පෙරේරා (අගෝස්තු මස දක්වා) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පර්යේෂණ ක්‍රමවේදය | සිංහල සහ ඉංග්‍රීසි |
| එම්. පී. පී. හේමකුමාර මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කළමනාකරණය සහ ගිණුම්කරණය | සිංහල සහ ඉංග්‍රීසි |
| කේ. පී. මාතොටආරච්චි මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ආර්ථික විද්‍යාව | සිංහල සහ ඉංග්‍රීසි |
| කේ. ඩී. එන්. හේවගේ මයා (අධ්‍යයන නිවාඩු) | කථිකාචාර්ය (පරිවාස) | සංඛ්‍යානය සහ ගණිතය | සිංහල සහ ඉංග්‍රීසි |
| ඩබ්. එස්. චන්ද්‍රසේකර මයා (අධ්‍යයන නිවාඩු) | කථිකාචාර්ය (පරිවාස) | ප්‍රජා තොරතුරුවේදය | සිංහල සහ ඉංග්‍රීසි |

## 09.02 2014 වර්ෂයේ විධායක කාර්ය මණ්ඩලයේ තොරතුරු

| නම | තනතුරු නාමය | පාලන අංශය |
|---|---|---|
| එස්. සත්‍යසීලන් මයා (පඩි රහිත නිවාඩු) | **නියෝජ්‍ය ලේඛකාධිකාරී** | පරිපාලන සහ ආයතනික අංශය |
| ජේ. වී. එස්. එන්. ටී. සොයිසා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | මූල්‍යය අංශය |
| ජේ. පී. විපුලරත්න මයා (ඔක්තෝබර් දක්වා) | සහකාර ලේඛකාධිකාරී | විභාග අංශය |
| ඩී. සී. පෙරේරා (ඔක්තෝබර් සිට) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | විභාග අංශය |
| එච්. පී. ඩී. ශ්‍රියාණි (දෙසැම්බර් සිට) | සහකාර ලේඛකාධිකාරී | පරිපාලන සහ ආයතනික අංශය |

## 09.03 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු - 2014

| | නම | තනතුරු නාමය | අනුබද්ධිත අංශය |
|---|---|---|---|
| 1 | ඩී. ඒ. එස්. ඉන්ද්‍රනි මිය (ජූලි දක්වා) | ජේ. මාණ්ඩලික සහකාර (ලඝුලේඛක) | විභාග අංශය |
| 2 | එස්. කේ. මුදුන්කොටුව මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලඝුලේඛක) | පාලන අංශය |
| 3 | ඩී. ඩී. ඒ. මාලිනි මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍යය අංශය |
| 4 | ආර්. එම්. බී. මැණිකේ මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍යය අංශය |
| 5 | පී. එම්. එස්. පෙරේරා මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | විභාග අංශය |
| 6 | අයි. ඒ. පී. චන්ද්‍රමාලි මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | විභාග අංශය |
| 7 | එස්. එස්. රූපසිංහ මයා | මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍යය අංශය |
| 8 | එස්. ඒ. පී. එම්. ගුණසේකර මෙය | ලිපිකරු - ශ්‍රේණිය I | මූල්‍යය අංශය |
| 9 | එස්. ඒ. පී. එන්. දිසානායක මිය | ලිපිකරු - ශ්‍රේණිය I | පාලන අංශය |
| 10 | ආර්. එම්. එම්. පී. කරුණාරත්න මයා | පොත් තබන්නා - ශ්‍රේණිය II | මූල්‍යය අංශය |
| 11 | ඒ. ඒ. සී. ටී. කරුණාරත්න මිය | පරිගණක යෙදවුම් සහකාර - ශ්‍රේණිය III | පාලන අංශය |
| 12 | ජේ. ඒ. ඩී. ගීතිකා මිය | පරිගණක යෙදවුම් සහකාර - ශ්‍රේණිය III | පාලන අංශය |
| 13 | එම්.එස්.සී පෙරේරා මයා | බයිසිකල් පණිවිඩකරු | පාලන අංශය |
| 14 | ඩබ්.එච්.එස් සේනක මයා | රියදුරු - ශ්‍රේණිය I | පාලන අංශය |
| 15 | එම්. ඩී. එම්. යූ. සමරසේකර මයා | පුස්තකාල සහායක - ශ්‍රේණිය II | පුස්තකාලය |
| 16 | එච්. ඩී. ජයවීර මයා | කම්කරු - වි. ශ්‍රේණිය | මූල්‍යය අංශය |
| 17 | කේ. පී. මුනිදාස තැලිස් මයා | කම්කරු - ශ්‍රේණිය I | පුස්තකාලය |
| 18 | එස්. ඩී. එච්. යූ. සිරිරත්න මයා | කම්කරු - ශ්‍රේණිය III | පාලන අංශය |
| 19 | කේ. එම්. අයි. එම්. පෙරේරා මයා | කම්කරු - ශ්‍රේණිය III | විභාග අංශය |
| 20 | කේ. එල්. එම්. පියනන්ද මයා | කම්කරු - ශ්‍රේණිය II | පාලන අංශය |

## 09.04 2014 වර්ෂය තුළ පැවරුම් පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලයේ තොරතුරු

| අංකය | නම | තනතුරු නාමය | අනුබද්ධිත අංශය |
|---|---|---|---|
| 1** | බී. කේ. පී. අබේසූරිය මිය | අධ්‍යයන සමායෝජක - ඉංග්‍රීසි භාෂා වැඩසටහන | ඉංග්‍රීසි භාෂා අංශය |
| 2 | ඊ. එන්. සී. පෙරේරා මයා | සම්බන්ධීකාරක - ව්‍යාප්ති පාඨමාලා වැඩසටහන | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 3** | ටී. රාජේන්ද්‍රම් මයා | අධ්‍යයන සමායෝජක - දමිළ භාෂා වැඩසටහන | දමිළ භාෂා අංශය |
| 4 | පී. බී. පී. ඩී. ද සිල්වා මයා | උපදේශක - පරිගණක තාක්ෂණවේදය | සිස්කෝ ජාලකරණ විද්‍යායතනය(Cisco Networking Academy) |
| 5* | එස්. ඒ. පී. චන්ද්‍රකුමාර මයා | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ සහකාර | පාලන අංශය |
| 6* | ඒ. රූපසිංහ මෙය | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සහකාර | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 7* | ඩී. ඒ. එස්. ඉන්ද්‍රනි මිය (අගෝස්තු සිට) | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සහකාර | විභාග අංශය |
| 8 | ඩබ්. ඩී. එන්. අසංගිකා මෙය | පර්යේෂණ සහකාර | දමිළ භාෂා අංශය |
| 9 | ඩී. එම්. තෙවරප්පෙරුම මයා | පර්යේෂණ සහකාර | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 10 | පී. ඒ. ආර්. පී. අබේවර්ධන මෙය | පර්යේෂණ සහකාර | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 11 | එස්. ඒ. කේ. ධර්මදාස මයා | තාක්ෂණික සහකාර | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 12 | යූ. බී. බණ්ඩාර මයා | ව්‍යාපෘති සහකාර | මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය |
| 13 | ජේ. එස්. එච්. ප්‍රියදර්ශන මයා | ව්‍යාපෘති සහකාර | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 14 | බී. එම්. සී. කුරේ මෙය | ව්‍යාපෘති සහකාර | විභාග අංශය |
| 15 | ඩබ්. ඒ. එන්. විදුරංග මයා | ව්‍යාපෘති සහකාර | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 16 | ඩී. ඩබ්. එම්. ආර්. දහනායක මිය | ව්‍යාපෘති සහකාර | විභාග අංශය |
| 17 | එච්. ඒ. එස්. වික්‍රමසිංහ මෙය | ව්‍යාපෘති සහකාර | මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය |
| 18 | කේ. ඒ. ඩී. කේ. එස්. කළුගම්පිටිය මයා | ව්‍යාපෘති සහකාර | දමිළ භාෂා අංශය |
| 19 | පී. ඒ. ඩී. සී. රසංගිකා | ව්‍යාපෘති සහකාර | මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය |
| 20 | එන්. කේ. ඒ. ඒ. නිරෝෂන් මයා | ව්‍යාපෘති සහකාර | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 21 | කේ. පී. යූ. සංජීවනී මෙය | ව්‍යාපෘති සහකාර | ඉංග්‍රීසි භාෂා අංශය |
| 22 | එම්. අයි. ඉෆ්තිකාර් මයා | ව්‍යාපෘති සහකාර | සිස්කෝ ජාලකරණ විද්‍යායතනය(Cisco Networking Academy) |
| 23 | එස්. එල්. පී. විතානගේ මිය | ව්‍යාපෘති සහකාර | ව්‍යාප්ති වැඩසටහන් අංශය |
| 24 | ආර්. ඒ. එම්. ප්‍රියදර්ශනී | ව්‍යාපෘති සහකාර | පාලන අංශය |
| 25 | කේ. ටී. සී. කරුනානායක මෙය | ව්‍යාපෘති සහකාර | දමිළ භාෂා අංශය |
| 26 | බී. කේ. ආර්. දුල්මි මෙය | ව්‍යාපෘති සහකාර | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 27 | කේ. එච්. දිල්රුක්ෂි මෙය | ව්‍යාපෘති සහකාර | ඉංග්‍රීසි භාෂා අංශය |
| 28 | ආර්. එල්. යූ. රනවක මයා | ව්‍යාපෘති සහකාර | පාලන අංශය |
| 29 | ජේ.ඒ.ඩී.අයි නිරංග මයා | පර්යේෂණ සහකාර (පුහුණු) | ශ්‍රම අධ්‍යාපන උපාධි පාඨමාලා අංශය |
| 30 | ඩී.එන්.ඩී.එස් ගිනිගේ මයා | පර්යේෂණ සහකාර | සේගිස් කැම්පස් පාඨමාලා |
| 31 | බී.ටී.ආර් ෂෙරිෆා මෙය | ව්‍යාපෘති සහකාර | පුස්තකාලය |
| 32 | පී.එස් අයේෂා මෙය | ව්‍යාපෘති සහකාර . | විභාග අංශය |
| 33 | එම්.එස්.එස්.ආර් විරසිංහ මෙය | ව්‍යාපෘති සහකාර | ඉංග්‍රීසි භාෂා අංශය |
| 34 | ඩී.එස් මුරගේ මෙය | ව්‍යාපෘති සහකාර | මූල්‍යය අංශය |
| 35 | එස්.ආර්.එම්.අයි සඳමාලි මෙය | ව්‍යාපෘති සහකාර | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 36 | සුරේශ් ගමගේ මයා | පර්යේෂණ සහකාර (පුහුණු) | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය |
| 37 | කේ.ඩී.පී කුරගම මයා | රියදුරු | පාලන අංශය |
| 38 | කේ.පී.බී.එන් නිර්මාණි මෙය | ව්‍යාපෘති සහකාර | මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය |
| 39 | ඩී.වී.ඒ.කේ.එල් සේනාරත්න මෙය | ව්‍යාපෘති සහකාර | මූල්‍යය අංශය |
| 40* | කේ. ඩී. ඩී. ගුණසේන මයා | කාර්යාල සහකාර | පාලන අංශය |
| 41 | ආර්. එල්. පී. මදුරංග මයා | කාර්යාල සහකාර | මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය |
| 42 | කේ.එස්.එන් අසෝකා මිය | සනීපාරක | |

** පැවරුම් පදනම මත සේවයේ නියුක්ත සම්පත් දායකයින් * පැවරුම් පදනම මත සේවයේ නියුක්ත විශ්‍රාමික සේවකයින්

## 10. පුස්තකාලය

2002 වර්ෂයේ සිට කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන පීඨයට අයත් තාවකාලීන ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන මානව සම්පත් අභිවර්ධන ආයතනීය පුස්තකාලය ග්‍රන්ථ 23, 000 කින් සහ සය දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. ශ්‍රම අධ්‍යාපනය අවශ්‍යතා වෙනුවෙන් වූ ඉතා දුර්ලභ පොත්වලින් යුතු මෙම වටිනා සම්පත විශ්වවිද්‍යාලයීය ප්‍රජාවගේ උපයෝගීකරණය සඳහා ඉතා ඉක්මනින්ම ප්‍රතිසංවිධානය කළ යුතුව තිබේ.

2014 වසරේදී පුස්තකාලයේ මුළු සාමාජික සංඛ්‍යාව 1473 ක් විය. 2014 වසරේදී බැහැර දීමේ අංශයේ පොත් 23,000 ක් වූ අතර එසේම 2014 වසරේදී පුස්තකාලය සඳහා රුපියල් 133>840.70 ක් වැය කර නව පොත් 245 ක් මිලදී ගන්නා ලදී. ප්‍රදාන ලෙස පොත් 03 ක් ලැබිණි. ආයතනය 2014 වසරේදී වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් 69>785/- ක් වැය කරන ලදී.

**2014 වසරේ පුස්තකාලයේ ආදායම**

| ආදායම | රුපියල් |
|---|---|
| දඩ | රු.9>003.00 |
| පොත් අස්ථානගතවීම් | රු.1>118.75 |
| එකතුව | රු.10>121.75 |

## 11. 2014 වර්ෂය තුළ ආයතනය ලබා ගත් සංවර්ධනය සහ නව ළඟා කර ගැනීම්

- 2014 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් අංශ පහක් (05) යටතේ තුන්දහස් හයසිය දාහතක (3617) සහතිකපත්ලාභීන් සංඛ්‍යාවක් බිහි කරන ලදී. ඒ විද්‍යාපති උපාධිලාභීන් දෙසිය පහළොවක් (215) උපාධිධාරීන් එකසිය පනස්තුනක් (153) විධායක ඩිප්ලෝමාධාරීන් එකසිය නවයක් (109) ඩිප්ලෝමාධාරීන් දෙසිය විසි නවයක් (229) සහ සහතිකපත්ලාභීන් දෙදහස් නවසිය එකොළහක් (2911) වශයෙනි.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවකයන්ගේ ආකල්ප සහ කුසලතා සංවර්ධනය වෙනුවෙන් පැවැත්වූ වැඩමුළු 04 ක් සාර්ථකව නිම කිරීමට හැකි විය. මෙම වැඩමුළු සඳහා සහභාගී වූ සමස්ථ පිරිස දෙසිය විසිපහකි.

- 2014 වර්ෂයේදී ද මානව සම්පත් අභිවර්ධන ආයතනයේ යටිතල පහසුකම් සහ වැසිකිළි පද්ධතිය නවීකරණය කරන ලදී.

**********************************

## 12 මූල්‍ය ක්‍රියාකාරකම්

2014 වර්ෂය සඳහා සමස්ථ රාජ්‍ය ප්‍රතිපාදනය රුපියල් මිලියන 37 ක් විය. ආයතනය විසින් උපයන ලද ආදායම රුපියල් මිලියන 162 කි.

**2014 වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ ප්‍රධාන කරුණු**

| ආදායම × 1,000 | | | වියදම × 1,000 | | |
|---|---|---|---|---|---|
| 01 | රාජ්‍ය ප්‍රතිපාදන - පුනරාවර්තන | 25,000 | 01 | වේතන - අධ්‍යයන | 8,589 |
| 02 | රාජ්‍ය ප්‍රතිපාදන - ප්‍රාග්ධන | 12,000 | 02 | වේතන - අනධ්‍යයන | 14,479 |
| 03 | රාජ්‍ය පරිගණක ශිල්පීය ප්‍රතිපාදන | - | 03 | බාහිර කථිකාචාර්යවරුන් | 1,017 |
| 04 | ව්‍යාප්ති පාඨමාලා ආදායම | 162,515 | 04 | ශිෂ්‍යත්වයුම් සේවා | 3,862 |
| 05 | වෙනත් ආදායම් | 15,694 | 05 | නඩත්තු ගාස්තු | 1,176 |
| 06 | වෙනත් ආදායම් | 17,086 | 06 | මිලට ගැනීම් - ප්‍රාග්ධන | 3,339 |
| | | | 07 | ව්‍යාප්ත පාඨමාලා සඳහා වූ වියපැහැදම් | 156,814 |
| | | | 08 | වෙනත් වියදම් උපාධි ප්‍රදානෝත්සවය ආදිය සඳහා | 4,588 |

## මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය

### 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | 2014 | 2014 | 2013 | 2013 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 44,769,425 | | 49,006,665 | |
| ආයෝජන | 143,855,658 | | 101,236,292 | |
| | | 188,625,083 | | 150,242,957 |
| **ජංගම වත්කම්** | | | | |
| භාණ්ඩ ලේඛන/ තොග | 1,279,375 | | 1,582,625 | |
| වෙළෙඳ සහ සෙසු ලැබීම් | 15,775,110 | | 13,899,780 | |
| පෙර ගෙවීම් | 17,995 | | 141,695 | |
| සේවක ණය සහ අත්තිකාරම් | 3,976,376 | | 5,408,270 | |
| මුදල් සහ මුදල් සමතුලනයන් | 64,941,137 | | 41,038,774 | |
| | | 85,989,993 | | 62,071,144 |
| **මුළු වත්කම්** | | 274,615,076 | | 212,314,101 |
| **වගකීම්** | | | | |
| ජංගම වගකීම් | | | | |
| ඉතුරුම් | 1,156,925 | | 830,600 | |
| උපචිත ගෙවීම් | 126,402,304 | | 28,526,650 | |
| | | 127,559,229 | | 29,357,250 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ගෙවිය යුතු වියදම් | 1,352,218 | | 81,458 | |
| පාරිතෝෂික සඳහා වෙන කිරීම | 17,426,850 | | 82,810,113 | |
| ඉදිරියට ලද ආදායම | 9,827,950 | | 8,688,060 | |
| | | 28,607,018 | | 91,579,631 |
| **මුළු වගකීම්** | | 156,166,247 | | 120,936,881 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 118,448,829 | | 91,377,220 |
| **ශුද්ධ වත්කම් / සම වත්කම්** | | | | |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 47,070,927 | | 50,442,364 | |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 15,668,896 | | 7,008,337 | |
| සමුච්චිත අරමුදල් | 40,504,576 | | 28,393,047 | |
| පරිත්‍යාග | 6,742 | 103,251,140 | 8,831 | 85,852,579 |
| **විශේෂිත අරමුදල්** | | | | |
| මා.ස.අ.ආ සංවර්ධන අරමුදල | 11,190,717 | | 5,107,055 | |
| රක්ෂණ යෝජනා ක්‍රමය | 3,997,972 | | 408,586 | |
| උත්පාදන අරමුදල | 9,000 | 15,197,689 | 9,000 | 5,524,641 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම** | | 118,448,829 | | 91,377,220 |

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ කාර්ය සාධනය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ ආධාර පුනරාවර්තන | 25,000,000 | 32,403,000 |
| ක්‍රමක්ෂය රජයේ ආධාර ක්ෂය වීම | 9,296,416 | 5,730,130 |
| ආදායම - වෙනත් ආදායම | 17,086,117 | 15,693,532 |
| ආදායම -ව්‍යාප්ති වැඩසටහන් | 162,515,433 | 150,251,075 |
| | **213,897,966** | **204,077,737** |
| **මෙහෙයුම් වියදම්** | | |
| කාර්යමණ්ඩල වැටුප් | 26,042,169 | 24,352,481 |
| ගමනාගමන වියදම් | 326,724 | 34,758 |
| සැපයුම් සහ පරිභෝජන | 1,228,813 | 3,674,342 |
| නඩත්තු කාර්යයන් | 1,176,058 | 1,178,481 |
| ගිවිසුම් සේවා | 3,861,535 | 3,029,149 |
| සෙසු මෙහෙයුම් වියදම් | 3,032,310 | 4,017,198 |
| පාරිතෝෂික | 10,076,171 | 10,284,191 |
| ක්ෂය වීම් | 156,813,955 | 142,333,019 |
| ව්‍යාප්ත වැඩසටහන් පිළිබඳ වියදම් | | |
| **මුළු මෙහෙයුම් වියදම්** | **202,557,734** | **188,903,619** |
| | | |
| **ශුද්ධ අතිරික්තය/ කාලපරිච්ඡේදය සඳහා (හිඟය)** | **11,340,232** | **15,174,118** |

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/සී/අයිඑච්ආර්ඒ /1/14/එෆ්ඒ   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2015 නොවැම්බර් 24 දින

අධ්‍යක්ෂ,

මානව සම්පත් අභිවර්ධන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  oaggov@sltnet.lk  www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළයුතු වුවත් ආයතනය විසින් දැනට භුක්ති විඳින කොළඹ විශ්වවිද්‍යාලය විසින් 1983 නොවැම්බර් 14 දිනැති ලිපිය මඟින් පවරා දෙන ලද පර්චස් 27.86 ක් වූ ඉඩම ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.2,961,340 ක් වූ මෝටර්රථ තවදුරටත් ආයතනය ප්‍රයෝජනයට ගනිමින් පැවතුන ද එහි සාධාරණ අගය පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.7,276,370 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි.

2.2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනය විසින් ආරම්භ කර තිබුණු රක්ෂණාවරණ යෝජනා ක්‍රමය සඳහා සංවර්ධන අරමුදලින් රු.1,000,000 ක අරමුදලක් මාරු කර තිබූ අතර ශාස්ත්‍රීය කමිටු නියෝග අනුව පාඨමාලා ආදායමින් සියයට 1 ක් වූ රු.4,188,040 ක මුදලක් මෙම අරමුදලට බැර කර ඇතත් මේ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

වැඩ තහනම් කර ඇති ආචාර්යවරයෙකුගෙන් රු.191,000 ක ආපදා ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 371 | භාණ්ඩාගාර අරමුදලින් ලබාදුන් හඳුනානොගත් රු.220,479 ක් අත්තිකාරම් නොපියවා තිබුණි. |
| (ආ) | 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එකතුව රු. 22,537,408 ක අරමුදල් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 13 දිනැති අංක 49 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,340,232 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,174,118 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,833,886 කින් අඩුවීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු.7,403,000 කින් අඩු වීම සහ සේවක වැටුප් රු.1,689,688 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ආයතනය විසින් අඛණ්ඩව මාස 15 ක් තිස්සේ රු.20,000,000 ක මුදලක් නිවේදනීය තැන්පතු වල ආයෝජනය කර තිබූ අතර එම මුදල ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කටයුත්තක හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන මාර්ගයක යෙදවීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

ආයතනය සතු බැංකු ගිණුම් 05 කට අදාලව එකතුව රු. 37,648,113ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් ඌන උපයෝජිතව පැවතුණි.

4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

ආයතනයේ පවතින ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා 2014 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු රු.12,000,000ක මූලධන ප්‍රතිපාදනය 2015 ජූලි 30 දින දක්වා අදාල කාර්යය සඳහා භාවිතයට ගෙන නොතිබූ අතර 2013 සහ ඊට පෙර ලැබී තිබුණු මූලධන ප්‍රතිපාදන රු.3,668,896ක් ද ඌන උපයෝජිතව පැවතුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට වැය නොකල ප්‍රතිපාදන රු. 15,668,896ක් විය.

05. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ගිණුම්කරණය

(ඇ) මූල්‍ය කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (02) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) ඒ වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| 2 2.1 මූල්‍ය ප්‍රකාශන තත්වාගණනය කළ මතය | මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | එකඟ වේ. | |
| 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br>2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙලිදරව් කළ යුතු වුවත් ආයතනය විසින් දැනට භුක්ති විඳින කොළඹ විශ්වවිද්‍යාලය විසින් 1983 නොවැම්බර් 14 දිනැති ලිපිය මගින් පවරා දෙන ලද පර්චස් 27.86 ක් වූ ඉඩම ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙලිදරව් කර නොතිබුණි. | ඉඩමේ අයිතිය සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කිරීම සඳහා අදාළ තොරතුරු ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර නොමැත. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| | (ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.2,961,340 ක් වූ මෝටර්රථ තවදුරටත් ආයතනය ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද, එහි සාධාරණ අගය පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම වාහන ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යාවා ඔවුන් විසින් වාහන පරීක්ෂා කිරීමටද පැමිණ ඇති අතර මේ දක්වා ප්‍රත්‍යාගණන වාර්තාව එවා නැත. ඒ සම්බන්ධව සිහි කැඳවීමේ ලිපියක් යවා ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම් ලබා දීමෙන් පසු එම වටිනාකම් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. | 2015 වර්ෂයේ දි ප්‍රත්‍යාගණන වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත. |
| 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු | සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.7,276,370 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කර තිබුණි. | 2015 වසරේ සිට ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා ජංගම ගිණුමක් ආරම්භ කර මෙම වරද නිවැරැදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරැදි කර ඇත. |
| 2.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනය විසින් ආරම්භ කර තිබුණු රක්ෂණාවරණ යෝජනා ක්‍රමය සඳහා සංවර්ධන අරමුදලින් රු.1,000,000 ක අරමුදලක් මාරු කර තිබූ අතර ශාස්ත්‍රීය කමිටු නියෝගය අනුව පාඨමාලා ආදායමින් සියයට 1 ක් වූ රු.4,188,040 ක මුදලක් මෙම අරමුදලට බැර කර ඇතත් මේ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2016 වර්ෂයේ සිට රක්ෂණාවරණ ක්‍රමය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 වර්ෂයේදි නිවැරැදි කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | වැඩ තහනම් කර ඇති ආචාර්යවරයෙකුගෙන් රු.191,000 ක ආපදා ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය මුදල ආයතනයේ කථිකාචාර්යවරයෙකුව සිට දැනට වැඩ තහනමකට ලක්ව ඇති වී. අයි. ඩී. ජේ. පෙරේරා මයාගේ ආපදා ණය මුදල වන අතර ඔහුට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතින බැවින් එය අවසන් වන තෙක් ණය මුදල අය කර ගැනීම ප්‍රමාද වෙමින් පවති. | |
| 2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම<br>නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 371 | භාණ්ඩාගාර අරමුදලින් ලබා දුන් හඳුනා නොගත් රු.220,479 ක් අත්තිකාරම් නොපියවා තිබුණි. | 2000 වසරට පෙර සිට පවතින මෙම හඳුනා නොගත් අත්තිකාරම් මුදල ලිහා හැරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අවසර ඉල්ලා ලිපියක් යවා ඇත. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| (ආ) 2004 ජූලි 29 දිනැති පීඩී/ 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එකතුව රු.22,537,408 ක අරමුදල් ආයෝජනය කර තිබුණි. | මෙම ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ ලිපි භාණ්ඩාගාරය වෙත යවා ඇත. | |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 19 දිනැති අංක 49 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනවල වැරැදි ඉදිරියේදී නිවැරැදි කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 3. මූල්‍ය සමාලෝචනය<br>3.1 මූල්‍ය ප්‍රතිඵලය | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,340,232 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,174,118 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,833,886 කින් අඩුවීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු.7,403,000 කින් අඩු වීම සහ සේවක වැටුප් රු.1,689,688 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | එකඟ වේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| 4 මෙහෙයුම් සමාලෝචනය<br>4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා | ආයතනය විසින් අඛණ්ඩව මාස 15 ක් තිස්සේ රු.20,000,000 ක මුදලක් නිවේදනිය තැන්පතුවල ආයෝජනය කර තිබූ අතර එම මුදල ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කටයුත්තක හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන මාර්ගයක යෙදවීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | ඉදිකිරීමට යෝජිත ආයතන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් ප්‍රමාද වීම මෙම මුදල් ඇමතුම් තැන්පතුවලින් මුදවා ස්ථාවර තැන්පතුවල ඵලදායිව ආයෝජනය කර නැත. | |
| 4.2 අරමුදල් ඌන උපයෝජනය | ආයතනය සතු බැංකු ගිණුම් 05 කට අදාලව එකතුව රු.37,648,113 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම ජංගම ගිණුම් 05 න් භාණ්ඩාගාර ප්‍රතිපාදන ගිණුමේ ඉතිරිව තිබුණේ ප්‍රාග්ධන ප්‍රතිපාදන (පුනරුත්ථපන වියදම්) සඳහා ලැබීම් වන අතර එම මුදල් දිගින් දිගටම ගිණුමේ ඉතිරිව තිබුණේ යෝජිත ආයතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ප්‍රමාද වීම නිසාය. පාඨමාලා අරමුදල් ගිණුමේ අතිරික්තව තිබූ මුදල් වසර පහ පුරාම පාහේ ආයෝජනය කර ඇති අතර ඔබගේ විගණන නිගමනයට අනුව ඉදිරියේදී අවම මුදල් ශේෂයක් පවත්වා ගනිමින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
| --- | --- | --- | --- |
| 4.3 නිශ්ක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම් | ආයතනයේ පවතින ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම සඳහා 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබූ රු.12,000,000 ක මූලධන ප්‍රතිපාදනය 2015 ජූලි 30 දින දක්වා අදාල කාර්ය සඳහා භාවියට ගෙන නොතිබූ අතර 2013 සහ ඊට පෙර ලැබී තිබුණු මූලධන ප්‍රතිපාදන රු.3,668,896 ක් ද ඌන උපයෝජිතව පැවතුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට වැය නොකල ප්‍රතිපාදන රු.15,668,896 ක් විය. | ඉදිකිරීමට යෝජිත ආයතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා මෙම මුදල් ඌන උපයෝජිතව පවතී. ආයතනයේ අභ්‍යන්තරික වෙනස් වීම් නිසා පෙර සිටි අධ්‍යක්ෂවරුන් ගොඩනැගිලි සැලසුම් කිහපවරක්ම වෙනස් කරමින් සකස් කර ඇති අතර ගොඩනැගිලි කමිටු රැස් වී සාකච්ඡා පවත්වා ඇත. මේ හේතුව නිසා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ අතර ගොඩනැගිල්ල ඉදි කරන මට්ටමේ පැවතුණි. නමුත් ආයතන අභ්‍යන්තරයේ වෙනස් වීම් නිසා ආයතන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් ප්‍රමාද වූ අතර ඉදිරියේදී ආයතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කළ පසු මෙම මුදල ඒ සඳහා යොදවනු ලැබේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2015 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| 6 පද්ධති හා පාලනයන් | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය. | | |
| | (අ) වත්කම් කළමනාකරණය | වත්කම් කළමනාකරණය සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර උපදෙස් ලබා දී ඇති අතර නිවැරැදි ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ. එසේම සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වාහන සඳහා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | |
| | (ආ) ගිණුම්කරණය | ගිණුම්කරණයේ පවතින අඩුපාඩු මග හරවා ගැනිම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර උපදෙස් ලබා දී ඇත. | |
| | (ඇ) මූල්‍ය කළමනාකරණය | පවතින නිති රීති රෙගුලාසිවලට අනුව හැකිතාක් නිවැරැදිව මූල්‍ය කටයුතු පාලනය කිරීමට කටයුතු කරනු ලැබේ. | |